Article 12(1)

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 9th April 2021 |

පැමිණිලි පාර්ශවය : ඩී.එන්.එස්.ද සිල්වා මිය,
දූව පාර, අකුරල,
කහව (අම්බලන්ගොඩ).

වගඋත්තර පාර්ශවය : 01. ඩබ්.එෆ්.යූ. ප්‍රනාන්දු මයා,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති,
ජ්‍යෙෂ්ඨ නියොජ්‍ය පොලිස්පති කාර්යාලය,
දකුණු පළාත, මාතර.

වර්තමාන ලිපිනය - පොලිස් මූලස්ථානය, කොළඹ 01

02. පො.ප. තිලක් රංජිත් මයා,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය,
දකුණු පළාත, මාතර.

03. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ.

<u>පැමිණිලි අංකය : HRC/76/18</u>

**පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම :-**

ඉහත නම් සදහන් පැමිණිලිකාරිය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කරමින් සදහන් කර ඇත්තේ, තමා 2003.01.05 වන දින කාන්තා පොලිස් කොස්තාපල්වරියක් ලෙස පොලිස් සේවයට බැදුනු බවත්, පසුව 2012 වර්ෂයේදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දකුණු පළාත් කාර්යාලයට අනුයුක්තව රාජකාරි කටයුතු කරමින් සිටින



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com

අතරතුර එවකට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිව සිටි සී.ඩී. වික්‍රමරත්න නැමති නිලධාරියා ස්ථානමාරු ලැබ ඒ වෙනුවට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස පත්වීම් ලැබූ ඩබ්.එෆ්.යූ. ප්‍රනාන්දු (දෙවන වගඋත්තරකරු) යන නිලධාරියා වැඩ භාරගත් බවත්ය.

දෙවන වගඋත්තරකාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ප්‍රනාන්දු යන නිලධාරියා විසින් නිතර නිතර තමාට මානසික පීඩන එල්ල කරන බවත්, ඉතා පහත් ආකාරයෙන් පරුෂ වචනයෙන් කථා කිරීම් කරන බවත් දන්වා ඇත. එසේම ඔහුගේ යට ඇඳුම් තමා භාවිතා කරනු ලබන පරිගණකය මත තබන බවත්, ඔහු විසින් සුරතලයට ඇති කරනු ලබන සුනඛයා කාර්යාල කාමරයේ තබා ගෙන නිතර නිතර එම සුනඛයා සුරතල් කිරීමට හා නිලධාරින් ද එයට සම්බන්ධ කර ගැනීමට කටයුතු කරන බවත්, එම සුනඛයා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ කකුල් දෙක අතර රදවාගෙන බල්ලාගේ මැක්කන් ගැලවීමට පවසන ලද බවත්, දක්වා ඇත.

තවද තම දරුවා ශිෂ්‍යත්ව විභාගය සමත්වීම හා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිගේ පුතා ශිෂ්‍යත්ව විභාගය සමත් නොවීම සම්බන්ධව කේන්තියෙන් තමා සමග කටයුතු කළ බවද පැමිණිලිකාරිය ප්‍රකාශ කර ඇත. දිනක් තමාගේ දකුණු අතින් අල්ලා 'කලබල කරන්න එපා' යැයි පැවසූ අතර, තමා ඔහුව තල්ලු කර දමා කාමරයෙන් එළියට පැමිණි බවත්, හැකි සෑම ඉහළ නිලධාරියෙකු වෙතම ඒ සම්බන්ධයෙන් පැමිණිලි කළ බවත්, ඒ කෙරෙහි උරන වූ නියෝජ්‍ය පොලිස්පතිවරයා අභූත චෝදනා නගමින් තමාව මාතර පොලිස් ස්ථානය වෙත ස්ථානමාරු කළ බවත් සදහන් කර ඇත. මෙලෙස දිගින් දිගටම තමාගේ රාජකාරි ජීවිතයට හා පුද්ගලික ජිවිතයට අනවශ්‍ය බලපෑම් සිදු කරමින් අසාධාරණයක් සිදු කිරීම හා කරණු ලැබූ හිංසනය සම්බන්ධයෙන් සොයා බලා සාධාරණයක් ඉටු කරන ලෙස වැඩිදුරටත් පැමිණිල්ලෙන් ඉල්ලා ඇත.

**01 වන වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම =:**

01 වන වගඋත්තරකරු විසින් 2018.07.12 දිනැතිව ඉදිරිපත් කර ඇති වාර්තාවට අනුව, ඔහු 2016.09.15 වන දින සිට දකුණු පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙස රාජකාරි භාරගත් බව සනාථ වේ. තම රාජකාරි ස්ථානයේ නිල ඇඳුම් හා සිවිල් ලෙස කාර්ය මණ්ඩල දෙකක් සිටින බවද, නිල ඇඳුම් කාර්ය මණ්ඩලයේ ප්‍රධානියා ලෙස පුද්ගලික සහකාර රාජකාරි කරන බවත්, සිවිල් කාර්ය මණ්ඩලයේ ප්‍රධානියා ලෙස රාජ්‍ය කළමණාකරණ සහකාර කටයුතු කරන බවත් ප්‍රකාශ කර ඇත. නිල ඇඳුම් කාර්ය මණ්ඩලයේ නිලධාරින්ගේ රාජකාරි පැවරීම හා විනය පැවැත්වීම සහ නිල ඇඳුම් නිසි පරිදි පවත්වා ගෙන යාම එම නිලධාරියාගේ වගකීමක් බවත්, 01 වන වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත.

2017.12.18 වන දින තමා කාර්යාලයේ සිටියදී කා.පො.කො. 3127 නදීෂා සමත්මලී (පැමිණිලිකාරිය) නිලධාරිනිය විසින් ස්ථානමාරුවීමක් සම්බන්ධව අභියාචනයක් ඉදිරිපත් කර තිබූ බවත්, අදාළ ස්ථානමාරුව සම්බන්ධ අභියාචනය ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොමැති වූයේ එම කාලවකවානුව පළාත් පාලන මැතිවරණ පැවතීම හේතුවෙන් මත බවත් සඳහන් කර ඇත. මෙම ස්ථානමාරුව සම්බන්ධයෙන් තමාගේ පුද්ගලික ආරක්ෂක ලෙස කටයුතු කරනු ලැබූ පො.කො 77550 චින්තක යන නිලධාරියා ද අවස්ථා කිහිපයකදී ඉල්ලීම් කළ බවත්, පසුව එය සලකා බලන බව තමා විසින් සඳහන් කළ බවත් ප්‍රකාශ කර ඇත.

පසුව මෙම නිලධාරිනිය නීති කොට්ඨාශයේ රාජකාරි කරමින් සිටින අතරතුරදී තමාටත් තම කාර්යාලයේ සේවයේ නියුතු අනෙකුත් නිලධාරින්ටත් එරෙහිව පෙත්සමක් ලියමින් සිටින අවස්ථාවේදී අදාළ නිලධාරින් ඒ සම්බන්ධව කරනු ලැබූ දැනුම්දීම මත වහාම ක්‍රියාත්මක වන පරිදි මාතර පොලිස් ස්ථානය වෙත අනුයුක්ත කළ බව සඳහන් කර ඇත. පසුව මෙම නිලධාරිනියගේ ස්ථානමාරුව සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබූ පොකො 77550 නිලධාරියා පිළිබඳව සොයා බැලීමේදී මෙම නිලධාරිනිය හා චින්තක නැමති එම නිලධාරියා අතර අනියම් සම්බන්ධතාවයක් පවත්වා ගෙන යන බවට අනාවරණය වූ බවත් සඳහන් කර ඇත. එම තත්වය මත මෙම නිලධාරියා තමාගේ සමීපතම නිලධාරියෙකු වශයෙන් තම රාජකාරි කටයුතු කිරීමට සුදුසු නොවන බැවින් ඔහුව 2017.12.29 වන දින මාතර පොලිස් ස්ථානය වෙත අනුයුක්ත කළ බවත්, ඉන් අනතුරුව තමාටත් තම කාර්යාලයේ සේවය කරනු ලැබූ නිලධාරින්ටත් එරෙහිව විවිධ ස්ථාන වෙත නාමිකව හා නිර්නාමිකවත් පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කර ඇති බවත් ප්‍රකාශ කර ඇත.

තවද මෙම නිලධාරිනිය සියළු පැමිණිලි හා කරුණු ඉදිරිපත් කර ඇත්තේ, තමාට විරුද්ධව ඉදිරිපත් කරනු ලැබූ ස්ථානමාරුවීම් වලින් පසුව බවත්, තමාගේ හෝ වෙනත් නිලධාරියෙකුගෙන් ලිංගික අතවරයක් හෝ වෙනත් අසාධාරණයක් සිදුවූවානම් ඒ සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට හෝ තොරතුරු සටහන් පොතේ ඇතුලත් කිරීමට හැකියාවක් තිබියදී එවැනි කිසිදු ක්‍රියාවක් සිදු නොකිරීම තුලින් ද්වේශසහගත ලෙස මෙම පැමිණිල්ල සිදු කර ඇති බව ද ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකාරිය වන නදීෂා සමත්මලී යන අය විසින් තමා වෙත කර ඇති චෝදනා සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කිරීම සිදු කිරීමට බලාපොරොත්තු නොවන බවද මෙම චෝදනාවන් හුදෙක්ම ද්වේශසහගතව තමා අපහසුතාවයට පත් කිරීමටත් තමාගේ කීර්තිනාමයට හානි කිරීමටත් එල්ල කර ඇති අභූත චෝදනා බව සඳහන් කර ඇති අතර, තමාගේ වසර 33ක් පමණ වන සේවා කාලය තුල කිසිදු අවස්ථාවක මෙවැනි ආකාරයේ චෝදනාවකට ලක්වී නොමැති බවද සඳහන් කර ඇත. තවද වගඋත්තරකරු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, මෙම නිලධාරිනියට අසාධාරණයක් සිදු කිරීමේ අරමුණින් කිසිදු ක්‍රියාමාර්ගයක් තමා විසින් ගෙන නොමැති බවත් නිලධාරිනිය විසින්

හෝ ඇයට සම්බන්ධතාවයක් දක්වන භාහිර පාර්ශවයන් විසින් තමාටත් තම පවුලේ සාමාජිකයින්ට හා දකුණු පලාත් ජ්‍යෙෂ්ඨ පොලිස්පති කාර්යාලයේ සේවය කරනු ලබන නිලධාරින්ට විරුද්ධව යම් තොරතුරු මාධ්‍ය ආයතනයන්වලට සහ සමාජ මාධ්‍යයන් වෙත ලබාදී තම කිර්තිනාමයට හානි කර තමාට අසාධාරණයක් සිදු කර ඇති බවයි.

**විමර්ශනයේදී අනාවරණය වූ කරුණු :-**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පැමිණිල්ලක් ගොනු කර තිබූ ඉහත නම් සඳහන් නදිෂා සමන්මලි නැමති නිලධාරිනිය 2012 නොවැම්බර් මස සිට දකුණු පලාත් නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයේ සේවය කර ඇත. සි.ඩී වික්‍රමරත්න මහතා ස්ථාන මාරුවීම් ලැබිමෙන් පසු 2016.09.15 දින සිට ඩබ්.ඒ.සී. ප්‍රනාන්දු මහතා දකුණු පලාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස වැඩ භාරගෙන ඇති අතර, මෙම පැමිණිලිකාරිය පසුව එම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති යටතේ සේවය කර ඇති බවට කරුණු අනාවරණය වේ.

මෙම පැමිණිලිකාර නිලධාරිනියට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් විවිධ හිරිහැර කරදර අසාධාරණකම් සිදු කරන බව සඳහන් කරමින් විවිධ ස්ථානවල පැමිණිලි කර ඇති බවට කොමිෂන් සභාව වෙත පැමිණිලි පාර්ශවය විසින් කරුණු ඉදිරිපත් කර ඇත. ඒ අනුව පොලිස් මූලස්ථානය වෙත හා පොලිස් කොමිෂන් සභාව වෙත ද පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත.

තවද පැමිණිලිකාරිය කොමිෂන් සභාව ඉදිරියේ කියා සිටිනු ලැබුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා සුනඛයෙකු ඇති දැඩි කරන බවත්, එම සුනඛයාගේ කටයුතු ද කිරීමට තමාට නියෝග කරන බවත් ය. මෙහිදී පැමිණිලිකාරිය විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් ඇති දැඩි කරනු ලබන සුනඛයා පිලිබඳව ජායා රූප හා තොරතුරු කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත.

තවද මෙම පැමිණිලිකාරිය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයේ සේවය කළ නොහැකි බව් සඳහන් කරමින් කරනු ලැබූ අභියාචනා පිලිබඳව විස්තර ලිඛිත හා වාචික ලෙස කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

මේ සියලු කරුණු වලින් ගම්‍ය වන්නේ වගඋත්තරකාර නියෝජ්‍ය පොලිස්පතිවරයා යටතේ සේවය කිරීම සම්බන්ධයෙන් පැමිණිලිකාරිය හට යම් අපහසුතාවයක් උද්ගතව ඇති බවයි. එය මාධ්‍ය මගින් ඉදිරිපත් කල ආකාරයට ලිංගික අතවරයන් ද යන්න නිශ්චිතව තහවුරු කර ගත නොහැකි මුත් නියෝජ්‍ය පොලිස්පතිවරයා හා මෙම නිලධාරිනිය අතර පැහැදිලි විරසකභාවයක් නිර්මාණය වී තිබෙන බවට කරුණු අනාවරණය වී ඇත.

තවද පැමිණිලිකාරිය විසින් විවිධ ස්ථානයන්හි සිදු කරනු ලැබූ පැමිණිලිවල ප්‍රතිඵලයක් ලෙස මෙම පැමිණිලිකාරිය කොළඹ දිස්ත්‍රික්කය වෙත ස්ථානමාරු කර ඇති අතර පළමුව පැමිණිලිකාරිය හංවැල්ල පොලිස් ස්ථානයට අනුයුක්ත කර ඇත. ඉන් පසුව හෝමාගම පොලිස් ස්ථානයටත් අනතුරුව සහකාර පොලිස් අධිකාරි කාර්යාලය හෝමාගම දකුණ, සහකාර පොලිස් අධිකාරි කාර්යාලය හෝමාගම උතුර, විශේෂ අපරාධ විමර්ශන ඒකකය හෝමාගම, සහකාර පොලිස් අධිකාරි කාර්යාලය හෝමාගම දකුණ ආදි ලෙස අවස්ථා ගණනාවකදි ස්ථානමාරු කිරීමට ලක්ව ඇති බව අනාවරණය වේ. කෙටි කාලයක් තුළ අවස්ථා 7කට වඩා වැඩි වාර ගණනක් නිලධාරිනිය මෙලෙස හේතු දැක්වීමකින් තොරව ස්ථානමාරු කිරීම මගින් නිරන්තරව අසාධාරණයට ලක්වන අතර, එම නිලධාරියාගේ අපේක්ෂිත සේවය ලබා ගැනීමේ හැකියාව ගිලිහි යයි.

තවද මෙම පැමිණිලිකාරිය ඇයගේ කුඩා දරුවාද සමග සැමියාගෙන් වෙන්ව වාසය කරන බැවින් පදිංචිය සඳහා නිශ්චිත ස්ථානයක රැඳී සිටීමේ නොහැකියාවට ද මුහුණ දී ඇති බව අනාවරණය වේ.

නිගමනය =:

පැමිණිලිකාරිය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර සිටින පරිදි පැමිණිලිකාරියට වගඋත්තරකරුගෙන් ලිංගික හිංසනයක් සිදුවූවා ද යන්න නිශ්චිතව තහවුරු කිරීමට නොහැකි නමුත් පැමිණිලිකාර නිලධාරිනියට සේවය කිරීමට ඇති අපහසුතා දිගින් දිගටම ප්‍රකාශ කර සිටියදිත්, ඒ සම්බන්ධව නිසි ක්‍රියාමාර්ග නොගැනීමත් හා ඒ තුළින් පැමිණිලිකාරිය හට යම් හිංසනයක් සිදු කිරීම මත අදාළ වගඋත්තරකාර පාර්ශවය විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකට ලක්ව ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

එබැවින්, පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි හා අභියාචනා විභාග කර සහනයක් ලබාදීමට කටයුතු කර නොමැති බැවින් මෙම සිද්ධිය සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කළ යුතු බවට පොලිස්පති වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2021..05.30 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තියත ප්‍රකාරව 01 වන වගඋත්තරු වෙත දන්වමි.

එසේම එකී නිර්දේශය කිකුයාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු අතර එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම් දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri L...

පිටපත :- සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

R/-